පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 06 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## විෂයය :- කතෝලික ධර්මය - I , II

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ලූක් සුභාරංචියේ සංකේතය වන්නේ,

1) සිංහයා 2) මිනිසා 3) ගවයා

02. පංච පුස්තකයට අයත් නොවන ග්‍රන්ථයකි.

1) සලමොන්ගේ ප්‍රඥාව
2) ගණන් කතාව
3) නික්මයාම

03. අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ සත්‍යතා ගණන,

1) 12 කි 2) 16 කි 3) 10 කි

04. දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්යක් සිදුවූ නගරයකි.

1) කානා නුවර
2) ලන්චියානෝ නගරය
3) බෙත්ලෙහෙම් නගරය

05. තමාට වෙඩිතැබූ සතුරාට සිරගෙදරට ගොස් සමාව ලබාදුන්නේ,

1) 16 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා
2) 2 වන ජුවාම් පාවුලු පාප් වහන්සේ
3) 6 වන පාවුලු පාප් වහන්සේ

06. නෙළූ රූප හා පිළිම වලට වන්දනා කිරීමෙන් කඩවන දේව පනත වන්නේ,

1) පළමු පනත
2) 10 වන පනත
3) 5 වන පනත

07. මරියතුමියගේ ඥාතිවරියකි,

1) මරිය ගොරෙත්ති තුමිය
2) එලිසබෙත් තුමිය
3) ඇග්නස් තුමිය

08. දසපනත ලබා දුන්නේ,

1) සීනායි කඳු මුදුනේදී
2) කල්වාරි කඳු මුදුනේදී
3) හොරේබ් කන්දේදී

09. දේව මාතාවන් පරලොවට වැඩීමේ මංගල්‍ය සමරනු ලබන්නේ,

1) ජනවාරි 1 2) දෙසැම්බර් 8 3) අගෝස්තු 15

10. පැරණි ගිවිසුමේ සඳහන් යාච්ඥා පොත වන්නේ,

1) ගීතාවලිය
2) ලෙවී ව්‍යවස්ථාව
3) ද්විතීය නීති සංග්‍රහය (ලකුණු 2 x 10 = 20)

- **අංක 11 - 15 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(ශුද්ධ වූ තෛලය/ පූජකවරය / යාච්ඥා / දතට දත / තුන්කාලයේ ආරාධනාව)**

11. ඇසට ඇස .................................... යන කීම ඔබ අසා ඇත.

12. .................................... දිනකට තෙවරක් උච්චාරණය කරන යැදුමකි.

13. ඔබට පීඩා කරන අය උදෙසා .................................... කරන්න.

14. සේවයේ ප්‍රසාද නිධානයකි ....................................

15. ශුද්ධාත්ම වරම් ලැබීම .................................... මඟින් සංකේතවත් කරයි.

(ලකුණු 2 x 5=10)

- **පහත ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණද යොදන්න.**

16. අභිවෘද්ධි ආලේපය මඟින් පරිණත කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමේ වරප්‍රසාද ලැබේ. ( )

17. සෑම කිතුනු නිවසකම ශුද්ධ වූ බයිබලය ගෞරවාන්විතව තිබිය යුතුය. ( )

18. ශුද්ධ වූ මතෙව් තුමා වෛද්‍යවරයෙකි. ( )

19. එක්වරු ශීලය මඟින් ආත්ම දමනය කරනු ලබයි. ( )

20. සෑම ඉරුදිනක්ම ණය මංගල්‍යය දිනයකි. ( )

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

- **ප්‍රශ්න 6 ක් තෝරා පිළිතුරු සපයන්න.**

01.

i. ස්වාමිවාක් ආරාධනාව ඉගැන්වුයේ කවුද ? කා හටද ? (ලකුණු 2)

ii. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 3 ක් නම් කරන්න. (ලකුණු 3)

iii. යාච්ඤාවක ප්‍රධාන ලක්ෂණ 5 ඇතුළත්වන පරිදි ඔබ රාත්‍රි නින්දට යන විට කරන යාච්ඤාවක් ලියන්න. (ලකුණු 5)

02.

i. දස පනතේ 3 වන පනත නම් කරන්න. (ලකුණු 2)

ii. දස පනතේ 4 වන පනතට අනුව යුතුකම් ඉටු කළ යුතු පුද්ගලයන් 3 දෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

iii. දසපනතේ 1 වන පණත සුරැකීමට ඔබේ යහළුවාට ලබාදෙන මඟපෙන්වීම් 5 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

03.

i. පංච පුස්තකයේ පොත් 2 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. ජේසුස් වහන්සේ කුඩා කළ වර්ධනය වු ආකාර 03 ක් ලියා දක්වන්න. (ලකුණු 3)

iii. ජේසුස් වහන්සේගේ ළමා කාලය තුළින් පුංචි ඔබට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ලකුණු 5)

04.

i. යාච්ඤාව යනු කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 2)

ii. ශුද්ධ වු සභාවේ ශික්ෂා පද 03 ක් නම් කරන්න. (ලකුණු 3)

iii. ඉරු දින ශුද්ධ ලෙස ගත කිරීමට ඔබට කළ හැකි ක්‍රියා 05 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

05.

i. **"ඔබගේ ශ්‍රී කුසයෙහි ඵලවන් ජේසුස් ආශිර්වාද ලද්දාහු මය"** මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද ? (ලකුණු 2)

ii. දේව මාතාවන්ගේ මංගල්‍යයන් 3 ක් නම් කරන්න. (ලකුණු 3)

iii. දෙව් මව්ගෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ලකුණු 5)

06.

i. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන සංකේත 2 ක් ලියන්න. (ලකුණු 2)

ii. ආරම්භක දේව ප්‍රසාද නිධාන 03 ක් නම් කරන්න. (ලකුණු 3)

iii. සමඟි සන්ධානය දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමෙන් ලැබෙන වරප්‍රසාද 05 ක් ලියන්න. (ලකුණු 5)

07.

i. යාච්ඤා වර්ග 02 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. ශුද්ධ වු සභාවේ පොදු යැදුම් 03 ක් නම් කරන්න. (ලකුණු 3)

iii. රැකවල් දේව දූතයාට කරන යාච්ඤාව ලියා දක්වන්න. (ලකුණු 5)

**08. පහත මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.**

i. සුභාරංචි සතර

ii. අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

iii. දේව මාතා දර්ශනය වීම

iv. ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීමේ සිද්ධිය

v. සේවයේ ප්‍රසාද නිධාන (ලකුණු 5 x 2 = 10)